# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2248/38 - 2021 ඔක්තෝබර් මස 06 වැනි බදාදා - 2021.10.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

ජනා. කා. අංකය : පීඑස්/සීඑස්ඒ/00/1/14/28

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් විසිනි**

මුද්‍රාව

**ගෝඨාභය රාජපක්ෂ**

1. ගරු ධම්මික ප්‍රියන්ත සමරකෝන් ජයවර්ධන මැතිතුමා
   ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර
2. ගරු බේමා කුමුදිනී වික්‍රමසිංහ මැතිතුමිය
   ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර
3. ගරු ආර්. එම්. සෝභිත රාජකරුණා මැතිතුමා
   අභියාචනාධිකරණ විනිශ්චයකාර

වෙත,

ශුභාශිංසන පූර්වකවයි !

1978 අංක 4 දරන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 7 දරන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 2 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව 2021 ජනවාරි මස 28 වන දිනැති අධිකාර පත්‍රය මගින් විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් පිහිටුවා ඇති බැවින් ද,

මෙම කොමිෂන් සභාවට පැවරී ඇති කාර්යය භාරය ඵලදායීව ඉටු කිරීම සඳහා කොමිෂන් සභාව වෙත අතිරේක බලතල අවශ්‍ය බවට කොමිෂන් සභාව විසින් එකී පනතේ 7(2) වගන්තිය ප්‍රකාරව ඉල්ලීමක් කරනු ලැබ ඇති හෙයින් ද,


1A - G 35056 — 380 (2021/10)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1978 අංක 4 දරන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 7 දරන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 7 (2) වගන්තියේ (ඊ) උප වගන්තිය යටතේ නිශ්චිත වශයෙන් දක්වා ඇති බලතල ද මෙම කොමිෂන් සභාව වෙත මවිසින් තවදුරටත් පවරා දෙනු ලබන බව මෙයින් දන්වා සිටිමි.

ඔබතුමන්ලා ගේ විචක්ෂණභාවය, සාමර්ථ්‍යය හා පක්ෂපාතීත්වය ගැන මහත්වූ භක්තිය හා විශ්වාසය තබමින් පූර්වෝක්ත අධිකාර පත්‍රය මගින් පිහිටුවනු ලැබූ විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ ඉහතින් දක්වා ඇති කාර්යයන් ක්‍රියාවට නංවනු පිණිස අවශ්‍ය විය හැකි සියළුම පියවර ගන්නා මෙන් ඔබතුමන්ලාට මම මෙයින් නියම කරමි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ වර්ෂ දෙදහස් විසිඑකක් වූ ඔක්තෝබර් මස 06 වන දින වූ මෙදින කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

**පී. බී. ජයසුන්දර,**
ජනාධිපති ලේකම්.

10- 258

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.